**ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය - 2013**

**-------------------------------------------------------------**

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 05 දරන ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාල පනතේ 21(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මාණ්ඩලික විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 ගිණුම්කරණ අඩුපාඩු

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් ලෙස රු.34,630,676 ක් සහ සංවර්ධන වියදම් ලෙස රු.137,309,239 ක් දක්වා තිබුණි. එසේ වුවත් විද්‍යාලයේ පොදු ලෙජරය අනුව, ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා වර්ෂය තුළදී රු.45,767,415 ක් වැය කර තිබුණු අතර සංවර්ධන වියදම් සඳහා රු.126,042,304 ක් වැය කර තිබුණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමට වැය කළ රු.11,136,739 ක් අඩුවෙන් හා සංවර්ධන වියදම් රු.11,266,935 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය | අයවැය ලේඛණය පිළියෙල කොට අදාල මුදල් වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර පාලක මණ්ඩලය වෙතින් අනුමත කරවා ගත යුතු වුවත් 2013 අයවැය ලේඛනය සඳහා අනුමැතිය ලබාගෙන ඇත්තේ 2013 පෙබරවාරි 23 දිනදීය. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනයට අයවැයගත ශේෂපත්‍රය, අයවැයගත ආදායම් වියදම් ප්‍රකාශය හා අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුළත් කර නොතිබුණි |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් වලින් ජනනය වූ මූල්‍ය ප්‍රතිඵලය රු.1,115,201 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,410,036 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,294,835 ක වර්ධනයක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන වැඩිවීම මේ සඳහා ප්‍රධාන හේතුව වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,294,835 ක වර්ධනය සඳහා පසුගිය වර්ෂය හා සසඳන කළ සියයට 13 කට සමාන රු.13,955,952 ක්වූ වියදම වැඩිවීමට සාපේක්ෂව ආදායම රු.23,954,668 ක් හෙවත් සියයට 17 කින් වර්ධනය වීමද හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාණ්ඩලික විද්‍යාලය විසින් මෙහෙයවනු ලබන උපාධි පාඨමාලාවට සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී සිසුන් 102 බැගින් සහභාගි වී තිබූ අතර මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කර තිබූ තොරතුරු අනුව මෙම වර්ෂයේ සහ පෙර වර්ෂයේ පුහුණුව ලැබූ එක් උපාධිධාරියෙකු වෙනුවෙන් පිළිවෙලින් රු.1,626,436 ක හා රු. 1,422,321 ක පිරිවැයක් දරා තිබුණි.

(ආ) මාණ්ඩලික විද්‍යාලයේ කටයුතු පවත්වා ගෙන යාම සඳහා ත්‍රිවිධ හමුදාවලින් වැටුප් ලබන සේවා අංශයේ නිලධාරින් යොදවා තිබූ අතර මාණ්ඩලික විද්‍යාලයේ කටයුතුවලට අදාල ඉන්ධන වියදම් හා උපාධි අපේක්ෂකයන්ගේ විදේශගතවීම් සඳහා අදාල වියදම් එම හමුදා විසින් දරා තිබුණි. එවැනි වියදම් පිළිබඳ විස්තර නඩත්තු කර නොතිබූ බැවින් මාණ්ඩලික විද්‍යාලයේ කාර්ය සාධනය නිවැරදිව ඇගයීමට නොහැකි විය.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරි සැලැස්ම**

2013-2016 සංයුක්ත සැලැස්ම 2013 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම හා ප්‍රවර්ථන වර්ෂයට අදාල අයවැය ලේඛනය සැසඳීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සංයුක්ත සැලැස්මට පරිබාහිර කාර්යයන් ඉටුකිරීම සඳහා අයවැය ඇස්තමේන්තු අනුමත කර තිබුණද ඒ අනුව සංයුක්ත සැලැස්ම සංශෝධනය කර නොතිබූ අතර, එසේම අයවැය ලේඛනය පසුව සංශෝධනය කර තිබුණද ඊට අනුකූල වන පරිදි පළමු ක්‍රියාකාරි සැලැස්ම සංශෝධනය කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරි සැලැස්මෙහි සඳහන්වූ ඉලක්කයන් ඉටුකිරීම පිළිබඳව පරික්ෂා කළ හැකි වන සේ කාර්ය සාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

**5.2 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් බැහැරවීම්**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සීමිත ජාතික ලංසු කැඳවීමේදී සැපයුම්කරුවන්ට ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 21 ක අවම කාලයක් ලබා නොදීම.

(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.3 (ආ) වගන්තියට අනුකූල නොවන පරිදි, දෙවනවර ලංසු කැඳවීමේදී කලින් යොදාගත් ලංසු කැඳවීමේ ලේඛන යොදාගෙන තිබීම.

(ඇ) ලංසු භාරගැනීමේ දින සිට ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගැනීම දක්වා වූ මූලික කටයුතු වෙනුවෙන් මාස 06 ක් වැනි දිගු කාලයක් ගතකර තිබීම.

(ඉ) සැපයුම්කරුවන් සමග ගිවිසුම්වලට එළඹ නොසිටි නිසා නිකුත් කළ ඇනවුමේ සඳහන් පරිදි භාණ්ඩ සපයා නොමැති සැපයුම්කරුවන්ගෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකි වීම.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව මාණ්ඩලික විද්‍යාලයේ සභාපතිවරයා වරින්වර දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ගිණුම්කරණය
(ආ) ප්‍රසම්පාදනය